UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
2017 අප්‍රේල්
FIRST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL - NEW SYLLABUS) APRIL 2017

# BSCE 102: ථේරවාද බුදුදහමේ මූලධර්ම

<u>ප්‍රශ්න පහකට පමණක්</u> පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. ශ්‍රැතිය (අනුස්සව) පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් බුදුදහමෙන් විවේචනය වන අයුරු පැහැදිලි කරන්න.

2. සමාජයක් තුළ අන්‍යෝන්‍ය සුහදතාවත් ලෞකික අභිවෘද්ධියත් සලසාලීමේ මාර්ගයක් ලෙස බෞද්ධ පඤ්චශීල ප්‍රතිපදාව අගයන්න.

3. බෞද්ධ ප්‍රතිපදා මාර්ගයේ අනිවාර්ය අංගයක් වන ශ්‍රද්ධාවේ කාර්ය භාරය පරීක්ෂා කරන්න.

4. බුද්ධ කාලීනව පැවති හේතුඵල වාදී හා හේතුඵල වාදී නොවන චින්තනයන් සමග සසඳන විට බෞද්ධ පටිච්ච සමුප්පාදයේ ඇති සුවිශේෂත්වය අගයන්න.

5. බෞද්ධ අනාත්මවාදී ඉගැන්වීම සියලු සංඛත සහ අසංඛත ධර්ම කෙරෙහි බලපාන අයුරු පැහැදිලි කරන්න.

අනෙක් පිටුවට ...

6. "දුක පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මිනිසාට දුකෙහි ගැලී සිටීමට පොළඹ වන සුලු ඉගැන්වීමක් නොවේ" සාකච්ඡා කරන්න.

7. බුදුසමයේ පුනර්භවය පැහැදිලි කිරීමට කර්මය පිළිබඳ ඉගැන්වීම උපකාරී වන අයුරු විමසන්න.

8. සමාජ ප්‍රශ්න ඇතිවීම හා නිරාකරණය පිළිබඳ අදහස් ඔබ උගත් බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

9. "රටක සංවර්ධනය බලාපොරොත්තු විය හැක්කේ පරිපූර්ණ දේශපාලන හා ආර්ථික ක්‍රමයක් තුළිනි." මෙය බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් විමසන්න.

10. බුදුසමයෙහි පරම සැපය නිර්වාණය ලෙස හැඳින්වීමට හේතු කවරේදැයි පරීක්ෂා කරන්න.

==========